# තාක්ෂණයටත් මුදලටත් ගීතය බිලි වෙලා



## ප්‍රවීණ ගීත පද රචක වසන්ත කුමාර කොබවක

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යාපීඨය සංවිධානය කළ විද්‍යෝදය සාහිත්‍ය සම්මාන උළෙල එම විශ්වවිද්‍යාලයේ දී පසුගියදා පැවැත්වුණි. එහිදී විශිෂ්ටතම ගේය පද සංග්‍රහයට හිමි සම්මානය හිමි වූයේ ප්‍රවීණ ගීත පද රචක වසන්ත කුමාර කොබවක මහතා රචනා කළ 'පමා වී පිපුණු මල් සුවඳයි' කෘතියටය. මතු දැක්වෙන්නේ කොබවක මහතා සමඟ අප පැවැත්වූ සංවාදයක සටහනකි. කොබවක මහතා මෙරට ගීත ක්ෂේත්‍රයට විශිෂ්ට ගීත රචනා ගණනාවක් දායාද කළ ප්‍රතිභා සම්පන්න නිර්මාණ රචකයෙකි.**




**ඔබ මීට පෙර ඔබේ නිර්මාණ වෙනුවෙන් රාජ්‍ය සාහිත්‍ය සම්මානය ඇතුළු විවිධ සම්මාන ලබා ඇගැයීමට ලක් වූ අයෙක්. එහෙත් විද්‍යෝදය සම්මානය ලැබීම ඔබ ලද ඉහළම සම්මානයක් ලෙසින් ඔබ ප්‍රකාශ කොට තිබුණා. ඊට හේතුව කුමක්ද?**

ලංකාවේ ගීත පද රචකයකුට ලැබිය හැකි සියලුම සම්මාන මීට පෙර මා ලබා තිබෙනවා. එහෙත් විද්‍යෝදය සම්මානය මට විශේෂයි. ලංකාවේ එකම එක විශ්වවිද්‍යාලයයි මෙවැනි සම්මාන උළෙලක් පවත්වන්නේ. සාහිත්‍ය කෘති වෙනුවෙන් මේ කෘති විනිශ්චය කරන්නෙත් සම්මාන උළෙල සංවිධානය කරන්නෙත් විද්වතුන්ගේ මැදිහත්වීමෙන්. ගීතය පමණක් නොවේ සම්මානයට බඳුන්වන සෑම ක්ෂේත්‍රයක්ම වට කීපයකින් තෝරලා අවසාන වටයට හොඳම පොත් තෝරා දෙන්නේ ක්ෂේත්‍රයේ ඉහළම විද්වතකු වීම වැදගත්.

අනිත් අතින් හොඳම කෘතිය බවට පත්වන නිර්මාණය එසේ තෝරා ගන්නේ ඇයිද යන හේතු කාරණා සියල්ල විනිවිද භාවයක් ඇතිව ප්‍රකාශ කරල තමයි විද්‍යෝදය සම්මානය පිරිනැමෙන්නෙ. ඒ නිසා කාටවත් ඇඟිල්ල දික්කරන්න, චෝදනා කරන්න අමාරුයි සම්මානයේ විනිශ්චයන් සම්බන්ධයෙන්. එබඳු විද්වත් සභාවකින් විනිවිද භාවයක් ඇතිව පිරිනැමෙන සම්මානයක් හිමිවීම ඇත්තටම සතුටට කරුණක්.

**එහෙත් ගීතය වැනි මාධ්‍යයක් සාහිත්‍යාංගයකැයි සැලකීමට පවා පසුගිය කාලයේ අපේ ඇතැම් විද්වතුන් මැළිවුණා නේද?**

ඒක මෙහෙමනෙ. අපි ආධුනිකයන් හැටියට ඉන්නකොට ඇතැම් පරිණතයන් කියන සෑම දේම අදහන්න ගන්නවා. ඒත් පස්සෙ කාලෙ හිතෙනවා ඒ ඇතැම් ප්‍රකාශ හරහා ඔවුන් ප්‍රදර්ශනාත්මක වෙන්න උත්සාහගත් බව. යම් කිසි සාහිත්‍යාංගයක් තිබෙනවා නම් එය චූල සම්ප්‍රදාය ද මහා සම්ප්‍රදාය ද කියන එක නොවෙයි බලන්න ඕනෙ. එම සාහිත්‍යාංගය යම් කිසි ජන කොට්ඨාසයක් මත පැවැතෙමින් වැඩි වර්ධනය වෙනවා නම් එය අපට පිළිගන්න වෙනවා. එය රසිකයන් වැළඳගන්නා මාධ්‍යයක් බවට පත් වෙනවා.

ඇතැම් අය කවිය ගීතය ගැන විවිධ කතා කියනවා. සසඳන්න බලනවා. ඒවා ඒ ඒ කාලවලට විවේචනාත්මක වෙන්න පුළුවන්. ඒත් අද වන විට ගීතය කියන එක අතු ඉති දලා දලු ලා වැඩිලා විහිදුණු වින්දනාත්මක ක්ෂේත්‍රයක් බවට පත්වෙලා තියෙනවා. ගීතය සුභාවිත මට්ටමට ගෙන ඒමට හැකි වුණේ සාමූහික ලෙස බොහෝ දෙනා දුන් දායකත්වය අනුවයි. එබඳු සමස්ත සමාජය පිළිගත් තත්ත්වයට ආවට පස්සෙ කවුරුහරි ඒ ක්ෂේත්‍රය තවදුරටත් දිගින් දිගටම විවේචනය කරමින් කතා කරනවා නම් එතැන කුහකකමක් තියනව කියලයි මට හිතෙන්නෙ.

**ගීතයක කල්පැවැත්ම හා එහි සර්වකාලීන ගුණය තීරණය වන්නේ එහි සාහිත්‍යමය අංශය නැතහොත් පදමාලාව අනුව බවයි බොහෝ දෙනාගේ අදහස. මේ සම්බන්ධයෙන් ඔබේ මතය කුමක්ද?**

පනහ හැට දශක වෙද්දි අපේ ගීතය අනුකාරක ලක්ෂණ පහළ කළා. ඒ යුගයේ ඒ සඳහා යම් බලපෑමක් කරන්න නොලැබුණ තරම්. ඒත් මානවසිංහයන්, සුනිල් ශාන්ත, ආනන්ද සමරකෝන් වැන්නන් ගෙන් පටන්ගෙන එන ඊළඟ ප්‍රවාහය තුළ ගීත රචනාවක සාහිත්‍යමය පක්ෂය ගැන විශේෂයෙන් අවධානය යොමු කරල ගීත නිර්මාණ බිහිකිරීමට උනන්දු වුණා. පණ්ඩිත් අමරදේවයන් ප්‍රමුඛව හැට දශකයෙන් මෙහාට එද්දි පද මාලාවේ ඇති සාහිත්‍යමය ගුණය සහ එය ඇසුරු කරල තියෙන විදග්ධ සාහිත්‍ය හෝ ජනශ්‍රැතිය හෝ චිරිත් රීති හෝ අනුව සංගීතය නිර්මාණය කිරීමටත් උනන්දු වූ බව පෙනෙනවා.

ඩෝල්ටන් අල්විස්, ධර්මසිරි ගමගේ, මහාචාර්ය සුනිල් ආරියරත්න ඇතුළු තවත් අයගේ දායකත්වයෙන් හැත්තෑව දශකය පමණ වන විට ගීතය අපූර්ව තැනකට රැගෙන එන්නට සමත් වුණා. ඒ සඳහා පදමාලාවේ අපූර්වත්වය විශේෂ බලපෑමක් කළා. අපි ආධුනිකයන් හැටියට හැත්තෑව දශකයේ මැදභාගයේ පද රචනා ලියද්දි හොඳ ගීතයක් ලියන්න මහන්සි ගත්තෙ පද රචනාව ඒ අතරම වැදගත් යැයි ක්ෂේත්‍රය තුළ මතයක් තහවුරු වී තිබුණ නිසා. ඔබ කිව්වා වගේම අපූර්වත්වයෙන් යුත් පදමාලාවක් ගීතයට යොදා ගත්තොත් එහි කල්පවතින ගුණයක් තියෙනවා.

උදාහරණයකට මෑත කාලයේ දී රජී වසන්ත වෙල්ගම විසින් ලියන ලද

**'මේ තරම් සියුමැලි ද කළුගල් සිතන්නටවත් බැරි නිසා'**

කියන ගීතය මොනතරම් සම්භාවනාවට පාත්‍ර වුණාද? සමහර වෙලාවට ක්ෂේත්‍රයේම ඉන්න බොහෝ දෙනෙක් මේ පද රචකයා තවම දැකලවත් නැතුව ඇති. මේ ගීතය ඒ විදිහට රසිකයන්ගේ තුඩ තුඩ රැව්දෙන්න හේතු වුණේ එහි පද රචනාවේ තිබෙන අපූර්වත්වය කියලයි මට හිතෙන්නෙ.

**පද රචනාව ගීතයකට ඒ තරම් වැදගත් නම් ප්‍රබන්ධය, කවිය හෝ සෙසු සාහිත්‍ය මාධ්‍යයක් අභිබවා යන කෙබඳු භාෂා ප්‍රයෝගයක් ද හොඳ ගීත රචකයා අනුගමනය කරන්නේ? එබඳු පිරිපුන් බසක් මතු කිරීමට රචකයා සතුව කවර ගුණාංග ද තිබිය යුත්තේ?**

තාක්ෂණය ප්‍රබල නිසා අද බොහෝ දෙනා හිතනවා ඕනෑම දෙයක් ලියලා ගීතයක් හැටියට එළියට දාන්න පුළුවන් කියලා. ඔහේ මොනව හරි ලියලා ගීතයක් කළ පලියට ගීත රචකයෙක් වෙන්න බෑ. හොඳ රචකයකු වීමට දීර්ඝ කාලීන අභ්‍යාස අවශ්‍යයි. හොඳ නිර්මාණ ආශ්‍රය කිරීම අවශ්‍යයි. ජනශ්‍රැතිය, සම්භාව්‍ය සාහිත්‍යය ආදි අපේ සම්ප්‍රදාය අධ්‍යයනය කිරීම අවශ්‍යයි. විදෙස් නිර්මාණ ගැන අවධානය අවශ්‍යයි.

එහෙම නැතුව හිතුමතේට, කලබලේට මේ කලාව කරන්න බෑ. මගේ අත්දැකීමක් කිව්වොත් මගේ මුල්ම ගීතය එන්නෙ 1975 දී පාසල් ශිෂ්‍ය කාලයේ දී. ඊළඟ ගීතය එන්නෙ 1979 දී අවුරුදු හතරක්ම යනව ඊළඟ ගීතය ලියන්න. මේකට අධ්‍යයනය අවශ්‍යයි. අපි ඒක අදටත් කරනවා.

**වර්තමානයේ අපට ඇහෙන ගීත බොහොමයක් පරීක්ෂා කරලා බලද්දි ඒවායේ සංගීතයේ හා ගායනයේ යම් අපූර්වත්වයක් දැකිය හැකි වුවත් පදමාලා ඉතාම දුර්වල අගයක් ගන්නා බවයි පෙනෙන්නේ. වර්තමානය වන විට ගීතය පරිහානියට ලක්වීමට මෙය හේතුවක් වුණාද?**

මම හිතන්නෙ අපට අති දක්ෂ ගීත රචක පරපුරක් ඉන්නවා. ඒත් අද ගුවන් විදුලිය අකර්මණ්‍යයි. මහත් සේවාවක් කළ සමහර කැසට් ආයතන අඩපණයි. ඒ නිසා තමන්ට සල්ලි තියෙනවා නම් පමණක් නිර්මාණයක් කරගන්න වෙන තත්ත්වයක් තමයි දැන් තියෙන්නෙ. තාක්ෂණයටත් සල්ලි බලයටත් ගීතය බිලිවෙලා. ප්‍රතිභාවක් තිබුණත් අපේ රචකයන්ට එබඳු මූල්‍යමය ශක්තියක් නැති නිසා ඔවුන්ට නිහඬව ඉන්න වෙලා තියනවා. මුදලටයි බලයටයි ගීත රචනා කලාව යටවෙලා තියෙන්නෙ. ඒත් ඒවා මොනතරම් කල්පවතී ද කියන එක ගැටලු සහගතයි. කෙනෙක් කියල තියෙනවා ඔහු ලක්ෂ ගණනක් වියදම් කරලා ගීතයක් කළත් ඒක මිනිස්සු තේරුම්ගන්නෙ නෑ කියල. කෝටි ගාණක් වියදම් කළත් ගීතයක් තේරෙනවද නොතේරෙනවද? හොඳ ද නරකද කියල තීරණය කරන්න නිර්මාණය කරන කෙනාට බෑ. ඒක රසිකයාගේ වැඩක්.

සංවාද සටහන
ගාමිණී කන්දේපොළ